**ශීර්ෂය 238 - රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුවේ විගණකාධිපති වාර්තාව - 2017 වර්ෂය**

2017 අංක 32 දරන විසර්ජන (සංශෝධන) පනතින් සංශෝධිත 2016 අංක 24 දරන විසර්ජන පනතේ පළමුවන උපලේඛනයේ හා තෙවන උපලේඛනයේ සඳහන් ශීර්ෂය හා විෂය අංකය යටතේ වන විසර්ජන ගිණුම සහ සැසඳුම් ප්‍රකාශය, රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තිදෙපාර්තමේන්තුව විසින් විගණනයට ඉදිරිපත් කරන ලදී. එම ගිණුමෙන් හා සැසඳුම් ප්‍රකාශයෙන් නිරූපණය වන මූල්‍ය හා කාර්යසාධනය ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව ප්‍රකාරව විගණනය කරන ලදී.

## 1.2 ප්‍රධාන ගණන්දීමේ නිලධාරීන්ගේ හා ගණන්දීමේ නිලධාරිගේ මූල්‍ය කළමනාකරණය හා ගිණුම් කටයුතුභාවය පිළිබඳ වගකීම

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 124 ප්‍රකාරව රාජ්‍ය මුදල් ඉපැයීම සහ රජයට ලැබිය යුතු මුදල් එකතු කිරීම මෙන්ම රජයේ සියළුම මුදල් කටයුතු අධීක්ෂණය පිළිබඳ පොදු අවේක්ෂණයද මුදල් අමාත්‍යවරයා වෙත පැවරී ඇත. මුදල් අමාත්‍යවරයා විසින් එම වගකීම ඉටු කිරීම පිණිස මුදල් රෙගුලාසි 124(2) ප්‍රකාරව ප්‍රධාන ගණන්දීමේ නිලධාරීන් පත් කර ඇත. මුදල් රෙගුලාසි 125(1)(අ) ප්‍රකාරව දෙපාර්තමේන්තු ප්‍රධානියා තම දෙපාර්තමේන්තුවේ සියළු මුදල් ගණුදෙනු පිළිබඳව ගණන්දීමේ නිලධාරියා වන අතර ආදායම් ගණන්දීමේ නිලධාරියා භාණ්ඩාගාරය විසින් පත්කර ඇත. පාර්ලිමේන්තුව විසින් පනවන ලද සීමාවන් ඇතුළත තම කාර්යභාරයන් ඉටු කර ඉදිරිපත් කරනු ලබන ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150, හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රජයේ මුදල් රෙගුලාසි හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වා ගෙනයාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන අභ්‍යන්තර පාලනයන් සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම හා පවත්වා ගෙන යාමත් මෙම වගකීමට ඇතුළත්වේ.

## 1.3 විගණන විෂය පථය

ශීර්ෂය 238 - රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුවේ 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය හා භෞතික කාර්යසාධනය සම්බන්ධයෙන් සැලසුම් කිරීම, රාජ්‍ය වියදම්, රාජ්‍ය ආදායම්, මානව හා භෞතික සම්පත් කළමනාකරණය, අභ්‍යන්තර පාලන විධිවිධාන යොදා ගැනීම, නීති, රීති හා රෙගුලාසිවලට අනුකූලවීම හා පොත්පත්, ලේඛන, වාර්තා හා සැසඳුම් ප්‍රකාශන යාවත්කාලීන කර පවත්වා ගැනීම, ගිණුම් පිළියෙල කර කාලීනව ඉදිරිපත් කිරීම, කාර්යසාධන දර්ශක පදනම් කරගෙන අදාළ පාර්ශවයන් වෙත කාර්යසාධන වාර්තා නිකුත් කිරීම පිළිබඳව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2018 අගෝස්තු 23 දින දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද සැලැසුම්, ගිණුම්, සැසඳුම් ප්‍රකාශන හා කාර්යසාධන වාර්තා පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

**1.4 විගණන නිරීක්ෂණය**

2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුවේ සිදු කරන ලද විගණනයේදී අනාවරණය වූ විගණන නිරීක්ෂණ ඉහත 1.3 ඡේදයේ සඳහන් කර ඇති කළමනාකරණ විගණන වාර්තාවේ විස්තරාත්මකව දක්වා ඇත. එම නිරීක්ෂණවලින් ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ මෙම වාර්තාවේ 2.1 ඡේදයේ සිට 2.7 දක්වා ඡේදවල සඳහන් කර ඇත. මූල්‍ය පරිපාලනයේ ප්‍රමාණවත් බව තහවුරු වන පරිදි ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 128 හි සඳහන් විධිවිධාන ඉටුකිරීමේදී අනාවරණය වූ පහත සඳහන් සටහනේ සාරාංශගත කර දක්වා ඇති විගණන නිරීක්ෂණවලට යටත්ව ගණන්දීමේ නිලධාරී වශයෙන් තම ගිණුම් කටයුතුභාවය සතුටුදායක ලෙස ඉටු කර තිබුණු බව නිරීක්ෂණය විය.

| **මුදල් රෙගුලාසි 128(1) ප්‍රකාර ගණන්දීමේ නිලධාරීගේ ගිණුම් කටයුතුභාවය** | | **ගණන්දීමේ නිලධාරී එම විධිවිධානයට අනුගත වී නොතිබීම** | **නිරීක්ෂණය ඇතුළත් වාර්තාවේ ඡේද යොමුව** |
|---|---|---|---|
| මුදල් රෙගුලාසි | | | |
| 128(1)(අ) | රජය විසින් නියමකර දක්වා ඇති ප්‍රතිපත්තිය හා බලය දෙනු ලැබූ කටයුතු සඳහා මූල්‍ය ප්‍රතිපාදන සලසාදීමෙහිලා පාර්ලිමේන්තුවේ අභියෝගයන් ගැන සැලැකිල්ලට ගෙන තම දෙපාර්තමේන්තුවේ කටයුතු විචක්ෂණ භාවයෙන් යුක්තව සැලැසුම් කර ක්‍රියාත්මක කරන බව සහ ප්‍රස්තුත වර්ෂය සඳහා නියමිත වැඩසටහන සම්පූර්ණ කිරීමට සහ/ හෝ නියමිත ඉලක්කය සාක්ෂාත් කර ගැනීමට පරිශ්‍රමයක් දක්වා තිබීම. | 1. තිරසාර සංවර්ධන අරමුණු සම්බන්ධයෙන් තොරතුරු ක්‍රියාකාරී සැලැස්මට ඇතුළත් නොකිරීම. | 2.2.1 |
| | | 2. කාර්යභාරයන් ඉටු නොකිරීම | 2.2.2 |
| | | 3. අයවැය ඇස්තමේන්තු තාත්වික ලෙස පිළියෙල නොකිරීම | 2.3 |
| 128(1)(ආ) | තම දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය හා ගිණුම්කරණය සඳහා සංවිධානය සාර්ථක බවට සහ අවශ්‍ය අවස්ථාවලදී රජයට ලැබිය යුතු ගාස්තු නිවැරදිව නිශ්චය කිරීමට ඒවා ක්‍රමානුකූලව ද සම්පූර්ණයෙන්ම ද අප්‍රමාදව එකතු කර ගැනීමට සහ ලැබෙන මුදල් ගිණුම්ගත කිරීමට ද, රජය වෙනුවෙන් වගකීම්වලට බැඳීම් සඳහා බලය දීමට ද ඉටු කරන ලද සේවාවන් සැපයීම් අධීක්ෂණය හා පරීක්ෂා කිරීමට සහ එම රජයේ අරමුදලින් ඒ සඳහා | 1. අග්‍රිම ඇස්තමේන්තු පිළියෙල කිරීමේ අඩුපාඩු | 2.5 |
| | | 2. මානව සම්පත් කළමනාකරණයේ අඩුපාඩු | 2.6 |

| | | | |
|---|---|---|---|
| | අප්‍රමාදව හා නිවැරදිව ගෙවීම් කිරීමට ඉන් ප්‍රමාණවත් තරම් විධිවිධාන සලසා තිබීම. | | |
| 128(1)(ඊ) | ප්‍රධාන ගණන්දීමේ නිලධාරියා හෝ භාණ්ඩාගාර හෝ විසින් ඉල්ලා සිටින තොරතුරු, ප්‍රකාශ හා වාර්තා නිවැරදිව කලට වේලාවට ඉදිරිපත් කරන බව. | වාර්ෂික කාර්යසාධන වාර්තා නියමිත දිනට ඉදිරිපත් නොකිරීම. | 2.2.3 |

**මුදල් රෙගුලාසි 128(2) ප්‍රකාර රාජ්‍ය ආදායම් ගණන්දීමේ නිලධාරීගේ ගිණුම් කටයුතුභාවය**

-----------------------------------------------------------

| මුදල් රෙගුලාසි | | | |
|---|---|---|---|
| 128(2)(අ) | ආදායම් සංකේතයට අදාළ ආදායම් ඇස්තමේන්තු සම්පූර්ණ ලෙසත්, හැකිතාක් නිවැරදිවත් පිළියෙල කිරීම. | අපේක්ෂිත ආදායම රැස් කිරීමට නොහැකිවීම/ රැස්කළ හැකි ආදායම වැඩිවීමකදී හෝ අඩුවීමකදී ආදායම් ඇස්තමේන්තුව සංශෝධනය කිරීමට පියවර නොගැනීම | 2.3 |
| 128(2)(ඉ) | රාජ්‍ය ආදායම් එකතු කිරීම සම්බන්ධව කටයුතු කරන ගණන්දීමේ නිලධාරීන් සහ දෙපාර්තමේන්තු විමසා, රජයට ලැබිය යුතුව තිබෙන හිඟ ආදායම් අප්‍රමාදව එකතු කර ගැනීම සම්බන්ධව විශේෂ විධිවිධාන යොදන බව | ආදායම් සංකේතයට අදාළව ආදායම් රැස් කර ආයතනවලින් හිඟහිටි ආදායම් පිළිබඳ තොරතුරු කැඳවා නොතිබුණි./ තොරතුරු කැඳවා තිබුණත්, එම ආයතන විසින් තොරතුරු ඉදිරිපත් කර නොතිබුණි. | 2.3 |

## 2. ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ

## 2.1 දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යභාරයන්

(i) පෞද්ගලික, රාජ්‍ය සහ ජාත්‍යන්තර නියෝජිතයන් සම්බන්ධීකරණය කරමින් මැදිකාලීන අයවැය රාමුවක් තුළ රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තිය සම්පාදනය කිරීම.

(ii) බදු ප්‍රතිපත්ති සහ ඊට අදාළ අනෙකුත් අණ පනත් සකස් කිරීම. (තීරු බදු සහ වෙළෙඳ භාණ්ඩ බද්ද හැර)

(iii) රාජ්‍ය ආදායම් සහ ලැබීම් ඇතුළත්ව රාජ්‍ය මූල්‍ය පෙළගැස්ම සහ රාජ්‍ය මූල්‍ය ක්‍රියාකාරීත්වය කළමනාකරණය සහ නිරීක්ෂණය.

(iv) සියලුම වාර්තාකරණයන් ඇතුළත්ව 2003 අංක 03 දරන රාජ්‍ය මූල්‍ය කළමනාකරණ (වගකීම්) පනත ක්‍රියාත්මක කිරීම.

## 2.2 කාර්යසාධනය

----------------

### 2.2.1 සැලසුම් කිරීම

---------------

එක්සත් ජාතීන්ගේ සංවිධානය විසින් හඳුන්වා දී ඇති "තිරසර සංවර්ධන න්‍යාය පත්‍රය -2030" ට අනුගත වීම සඳහා පාර්ලිමේන්තුව විසින් නම්කර ඇති 2017 අංක 19 දරන ශ්‍රී ලංකා තිරසර සංවර්ධන පනත හා රජය විසින් නිකුත් කර ඇති චක්‍රලේඛ ප්‍රකාරව තිරසර සංවර්ධන ඉලක්ක ක්‍රියාත්මක කළ යුතු වේ. එසේ වුවද, තිරසර සංවර්ධන අරමුණු හා දර්ශක හඳුනා ගෙන ඒවා ළඟා කර ගත හැකි ආකාරයට වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්ම සකස් කර කටයුතු ක්‍රියාත්මක කිරීම කෙරෙහි දෙපාර්තමේන්තුවේ අවධානය යොමු වී නොතිබුණු අතර 2018 වර්ෂයේ ලිපිලේඛන අනුවද එවැනි හඳුනා ගැනීමක් හෝ සිදු කළ බව නිරීක්ෂණය නොවීය.

### 2.2.2 කාර්යභාරයන් ඉටු නොකිරීම

-----------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) රාජ්‍ය ආදායම් සහ ලැබීම් ඇතුළත්ව රාජ්‍ය මූල්‍ය පෙළගැස්ම සහ රාජ්‍ය මූල්‍ය ක්‍රියාකාරීත්වය කළමනාකරණය සහ නිරීක්ෂණය, දෙපාර්තමේන්තුවේ එක් ප්‍රධාන කාර්යයක් වේ. එම කාර්යය ඉටු කිරීමේ කාර්යසාධනය සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) අංක 01/2015 (v) දරන හා 2016 දෙසැම්බර් 30 දිනැති දෙපාර්තමේන්තු චක්‍රලේඛය මඟින් නිශ්චිතව එක් අමාත්‍යාංශයකට හෝ දෙපාර්තමේන්තුවකට විශේෂයෙන් පැවරිය නොහැකි ආදායම් සම්බන්ධයෙන් එම වගකීම අදාළ ආදායම් රැස් කරනු ලබන අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තු සහ ආයතන ප්‍රධානීන් විසින් සිදු කළ යුතු බව අවධාරණය කර තිබුණි. එහෙත් සිදු කරන ලද භෞතික පරීක්ෂාවේදී එම චක්‍රලේඛය ප්‍රකාරව ආදායම් සම්බන්ධ ඍජු වගකීමක් ආදායම් ගණන්දීමේ නිලධාරියා විසින් හෝ ආදායම් රැස් කරනු ලබන දෙපාර්තමේන්තු ප්‍රධානීන් විසින් හෝ නොදරන බවට නිරීක්ෂණය වූ නමුත් ඒ පිළිබඳව ඍජු අධීක්ෂණයක් රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව විසින් සිදු කර ඇති බව නිරීක්ෂණය නොවීය.

(ii) වෙනත් දෙපාර්තමේන්තු විසින් නව ආදායම් සංකේතයක් ඉල්ලා සිටීමේදී ඒ සඳහා ඉදිරි පියවර ගැනීමක් හෝ උපදෙස් ලබා දීමක් රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව විසින් සිදු නොකළ අවස්ථාවක් නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

(iii) 2017 දෙසැම්බර් 31 දින වන විට ලැබී ඇති නමුත් ආදායම් ගිණුමට ගිණුම්ගත නොකෙරුණු ආදායම් රු.මිලියන 3.04 ක් බැංකු ගිණුමක රඳවාගෙන තිබුණු අවස්ථාවක් නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

(iv) ආදායම් වාර්තා කිරීම මුදල් පදනම මත සිදුකල යුතු වුවද 2017 වර්ෂයේදී අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ආදායම් ඒකක 04 කින් ලද එකතුව රු. 697,600 ක ආදායම ගිණුම්ගත නොකර 2018 වර්ෂයේ ආදායමක් ලෙස ගිණුම්ගත කර තිබුණි.

(v) මුදල් රෙගුලාසි 570 හා 571 ප්‍රකාරව තැන්පත් කළ දින සිට වර්ෂ 2 ක් තුළ හිමිකම් ඉල්ලුම් නොකළ තැන්පතු කල් ඉකුත් වූ තැන්පතු ලෙස සලකා රාජ්‍ය ආදායමට බැර කළ යුතු වුවද රු.මිලියන 3.98 ක් වටිනා තැන්පතු 04 ක් රජයේ ආදායමට බැර කර නොතිබුණි.

(vi) සමාලෝචිත වර්ෂයට අදාළව සත්ව ආහාර පනත යටතේ කෙරෙන බලපත්‍ර ලබා දීම සඳහා වන ගාස්තු සමාලෝචනය කිරීමක් සිදු වී නොතිබුණු බව නියැදි විගණන පරීක්ෂණවලදී අනාවරණය වූ අතර එම ගාස්තු සංශෝධනය නොවීමේ කාල පරාසය වසර 4 ක සිට වසර 11 ක් දක්වා විහිදී තිබුණි.

(vii) ආදායම් ගිණුමට බැර නොකර රු.මිලියන 1.20 ක ලැබූ ආදායම ඊට අදාළ වියදම් දැරීම සඳහා විධිමත් අනුමැතියකින් තොරව තැන්පතු ගිණුමේ රඳවා ගෙන තිබුණි.

(ආ) දෙපාර්තමේන්තුව විසින් ආදායම් ඇස්තමේන්තු කිරීමේදී, විධිමත් සමාලෝචන හා විශ්ලේෂණ මත ආදායම් ඇස්තමේන්තු සිදු නොකිරීම හේතුවෙන් පහත සඳහන් අඩුපාඩු පැවති බව නිරීක්ෂණය විය.

(i) සමාලෝචිත වර්ෂයේ මූලික ආදායම් ඇස්තමේන්තුව හා වර්ෂය තුළ රැස්කළ සත්‍ය ආදායම් අතර සියයට 1 1 සිට 380 ක් දක්වා වාසිදායක විචලනයන් හා සියයට 11 ක සිට 100 ක් දක්වා අවාසිදායක විචලනයන් නිරීක්ෂණය විය.

(ii) සමාලෝචිත වර්ෂයේ සංශෝධිත ආදායම් ඇස්තමේන්තුව හා වර්ෂය තුළ රැස්කළ සත්‍ය ආදායම අතර සියයට 01 ක සිට 100 ක් වාසිදායක විචලනයන් හා සියයට 01 ක සිට 99 ක් දක්වා අවාසිදායක විචලනයන් නිරීක්ෂණය විය.

(iii) පසුගිය වර්ෂයේ හා සමාලෝචිත වර්ෂයේ පිළිවෙලින් රු. මිලියන 117.05 ක් හා රු. මිලියන 101.91 ක ආදායම් රැස් කර තිබුණද මූලික ඇස්තමේන්තුවක් හෝ සංශෝධිත ඇස්තමේන්තුවක් සකස් කර නොතිබුණු අවස්ථා නිරීක්ෂණය විය.

(iv) ආදායම් සංකේතාංක 06 ක මූලික ඇස්තමේන්තු සකස් කර වර්ෂය තුළ ආදායම් රැස් කර තිබුණද, මූලික ආදායම් ඇස්තමේන්තුව හා සත්‍ය ආදායම් අතර සියයට 87 ක අවාසිදායක විචලතාවයන් නිරීක්ෂණය විය. එසේ වුවද, සංශෝධිත ආදායම් ඇස්තමේන්තු සකස් කිරීමේදී ඒ පිළිබඳව සලකා නොතිබුණි.

(v) රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව විසින් හෝ අදාළ ආදායම් ගණන්දීමේ නිලධාරීන් විසින් එක් එක් ආදායම් සංකේතය යටතේ ගිණුම්ගත කළ යුතු ආදායම් පිළිබඳ විස්තරාත්මක තොරතුරු ඇතුළත් මාර්ගෝපදේශයන්/ උපදෙස් නිකුත් කර නොතිබුණි. ඒ හේතුවෙන් ආදායමෙන් ආපසු ගෙවීම් මෙන්ම වැරදි නිවැරදි කිරීම්ද පෙර වර්ෂයට වඩා වැඩි වූ අවස්ථා 09 ක් පැවති බව නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

(vi) සමාලෝචිත වර්ෂයේ අයවැය ඇස්තමේන්තුවක් හෝ සංශෝධිත ඇස්තමේන්තුවක් නොමැතිව ආදායම් රැස් කර තිබූ අවස්ථා 03 ක් නියැදි පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

(vii) මූලික අයවැය ඇස්තමේන්තුවක් පැවතියද ආදායම් රැස්කර නොතිබූ අවස්ථා 04 ක් නියැදි පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

(viii) බදු ආදායම් යටතේ වූ ආදායම් සංකේතාංකයක වසර ගණනාවක සිට පැවත එන රු.මිලියන 550.12 ක වටිනාකමකින් යුතු හිඟ ආදායම් පැවතියද, එම මුදල් අයකර ගැනීම සම්බන්ධයෙන් ආදායම් ගණන්දීමේ නිලධාරියා විසින් හෝ රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව විසින් හෝ ඊට අදාළ ඉදිරි ක්‍රියාමාර්ග ගෙන තිබූ බව විගණනයේදී නිරීක්ෂණය නොවීය.

(ඇ) සමාලෝචිත වර්ෂයේ වැටි බදු පියවීම සඳහා වෙන් කළ රු.මිලියන 24.14 ක ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු.මිලියන 23.74 ක් හෙවත් සියයට 98 ක් ඉතිරි වී තිබුණි. මෙම බදු පියවීම සඳහා යාවත්කාලීන නොවන ව්‍යාපෘති ලේඛනයක් දෙපාර්තමේන්තුව විසින් පවත්වා තිබුණු බවට නිරීක්ෂණය විය.

(ඇ) සියලුම වාර්තාකරණයන් ඇතුළත්ව 2003 අංක 03 දරන රාජ්‍ය මූල්‍ය කළමනාකරණ (වගකීම්) පනත ක්‍රියාත්මක කිරීම, දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යයක් වූ අතර ඒ සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය විය.

(i) ලිපිගොනුව අනුව, 2018 අගෝස්තු 16 දින වන විට වාර්ෂික වාර්තා පිටපත් 4000 කින් පිටපත් 885 ක් හෙවත් සියයට 22 ක් ඉතිරිව පැවතුණි. එහි පිරිවැය රු. 1,280,612 ක් විය.

(ii) පනතේ 10 වන වගන්තිය යටතේ වසර මැද රාජ්‍ය මූල්‍ය තත්ත්ව වාර්තාව ජුනි මස අවසාන දින හෝ විසර්ජන පනත සම්මත කරන ලද 2017 දෙසැම්බර් 09 වන දිනෙන් පසුව එළඹෙන මාස 06 එනම් ජුනි 09 දින යන දිනයන්වලින් පසුව එළඹෙන දිනයේ ප්‍රකාශයට පත් කළ යුතු වුවද අදාළ වාර්තාව මෙතෙක් ප්‍රකාශයට පත් කර නොතිබුණි.

**2.2.3 වාර්ෂික කාර්යසාධන වාර්තාව**

2002 සැප්තැම්බර් 12 දිනැති අංක 402 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් මුදල් වර්ෂය අවසන් වී දින 150 ක් ඇතුළත සමාලෝචිත වර්ෂයට අයත් කාර්යසාධන වාර්තාව පාර්ලිමේන්තුවේ සභාගත කළ යුතු වුවත්, එම වාර්තාව 2018 සැප්තැම්බර් 05 දිනවන විටත් පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි.

**2.3 කාර්යභාරයන් ඉටු කිරීම සඳහා පාර්ලිමේන්තුව විසින් සලසා තිබුණු ප්‍රතිපාදනය උපයෝජනය කිරීම**

2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂ 05 ක කාලය තුළ දෙපාර්තමේන්තුවට සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය, උපයෝජනය හා ඉතිරිය පිළිබඳ තොරතුරු හා ඒ පිළිබඳ විගණන නිරීක්ෂණ පහත දැක්වේ.

| වර්ෂය | වියදම් වර්ගය | ශුද්ධ ප්‍රතිපාදනය | උපයෝජනය | ඉතිරිය | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|---|
| | | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | |
| 2013 | පුනරාවර්තන | 97.4 | 68.4 | 29.1 | 30 |
| | මූලධන | 2.1 | 1.9 | 0.2 | 12 |
| | **එකතුව** | **99.5** | **70.3** | **29.3** | **29** |
| 2014 | පුනරාවර්තන | 74.77 | 74.73 | 0.04 | 0.05 |
| | මූලධන | 1.12 | 1.0 | 0.12 | 10.37 |
| | **එකතුව** | **75.79** | **75.73** | **0.15** | **0.20** |
| 2015 | පුනරාවර්තන | 75.9 | 70.4 | 5.4 | 7 |
| | මූලධන | 2.5 | 2.2 | 0.3 | 11 |
| | **එකතුව** | **78.4** | **72.6** | **5.7** | |
| 2016 | පුනරාවර්තන | 74.8 | 52 | 22.8 | 30 |

| | | | | | |
|---|---|---|---|---|---|
| | මූලධන | 2.6 | 1.1 | 1.5 | 56 |
| | **එකතුව** | **77.4** | **53.1** | **24.3** | **31** |
| 2017 | පුනරාවර්තන | 3,730.6 | 51.7 | 3,678.9 | 99 |
| | මූලධන | 3.6 | 0.4 | 3.2 | 89 |
| | **එකතුව** | **3,734.2** | **52.1** | **3,682.1** | **98.60** |

විසර්ජන ගිණුම සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය සඳහා දෙපාර්තමේන්තුවට සලසා තිබූ රු.මිලියන 3,734.19 ක මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් වියදම රු.මිලියන 52.05 ක් පමණක් විය. ඒ අනුව ඉතිරිය රු.මිලියන 3,682.13 ක් මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 99 ක් විය. 2006/2007 වසරවල සිංගප්පූරුවේ පැවැත්වූ ජාත්‍යන්තර බේරුම්කරණයේදී ප්‍රීමා ලංකා (පෞද්ගලික) සමාගමේ ගැටළු නිරාකරණය කිරීමට අදාළව 2017, 2018 හා 2019 වර්ෂවලදී රජය විසින් ගෙවීමට එකඟ වූ ඇ.ඩො. මිලියන 55 ක් ගෙවීම සඳහා දෙපාර්තමේන්තු වැය ශීර්ෂය යටතේ රු.මිලියන 3,635 ක මුදලක් වෙන් කර තිබුණද ඒ සඳහා මෙතෙක් ගෙවීම් කර නොතිබීම ඊට හේතු වී තිබුණි.

(ආ) 2017 වර්ෂය තුළ වාර්ෂික ප්‍රතිපාදනය රු.මිලියන 3 ක් වූ වැය විෂයක් සඳහා පරිපූරක ඇස්තමේන්තු හා මු.රෙ 66 මාරු කිරීම් යන ක්‍රම 02 යටතේ එකතුව රු.මිලියන 7.36 ක් හෙවත් වාර්ෂික ප්‍රතිපාදනයෙන් සියයට 245 ක අතිරේක ප්‍රතිපාදන ලබාගෙන තිබුණි.

(ඇ) වාර්ෂික ප්‍රතිපාදන එකතුව රු.මිලියන 44.5 ක් වූ පුනරාවර්තන උප වැය විෂයන් 02 කින් මු.රෙ. 66-69 යටතේ එකතුව රු.මිලියන 2.63 ක් හෙවත් වාර්ෂික ප්‍රතිපාදනයෙන් සියයට 03 සිට 09 දක්වා වූ අඩු කිරීම්ද, රු. මිලියන 1.2 ක වාර්ෂික ප්‍රතිපාදනය වූ තවත් වැය විෂයයක ප්‍රතිපාදනයට සියයට 35 ක් එකතු කිරීම් ද සිදු කර තිබුණි.

(ඈ) එක් වැය විෂයයක් සඳහා අයවැය ඇස්තමේන්තු මඟින් ප්‍රතිපාදන වෙන් කරගෙන නොතිබුණද, වර්ෂය තුළදී මු.රෙ 66 යටතේ රු.මිලියන 1.35 ක ප්‍රතිපාදන මාරු කරගෙන තිබුණි.

(ඉ) ශුද්ධ ප්‍රතිපාදන එකතුව රු.මිලියන 3,676.91 ක් වූ පුනරාවර්තන වැය විෂයයන් 11 ක හා එකතුව රු.මිලියන 3.21 ක් වූ ප්‍රාග්ධන වැය විෂයයන් 03 ක ඉතිරිවීම් එකතුව රු.මිලියන 3.69 ක් වූ අතර එය ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 13 ක සිට සියයට 100 ක් දක්වා පරාසයක විය.

## 2.4 ඇස්තමේන්තුගත හා තථ්‍ය ආදායම්

---

දෙපාර්තමේන්තුව විසින් 2017 වර්ෂය සඳහා එක් ආදායම් සංකේතාංකයකට ආදායම් ඇස්තමේන්තු සකස් කර නොතිබුණු අතර අනෙක් සංකේතාංකය සඳහා රු.මිලියන 5,000 ක ආදායම් ඇස්තමේන්තුවක් සකස් කර තිබුණි. ආදායම් ඇස්තමේන්තු සකස් කර නොතිබුණු සංකේතාංකය සඳහා රු.මිලියන 3.03 ක ආදායමක් රැස් කර තිබුණු අතර අනෙක් ආදායම් සංකේතාංකය සඳහා ආදායම් රැස් කර නොතිබුණි. විස්තර පහත දැක්වේ.

| ආදායම් සංකේතාංකය | 2017 දෙසැම්බර් 31 දිනට | | |
|---|---|---|---|
| | ඇස්තමේන්තුගත ආදායම | තථ්‍ය ආදායම | ඉක්මවීම / (ඌනතාවය) |
| | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන |
| 10.02.10.00 | නැත | 3.03 | 3.03 |
| 20.05.01.00 | 5,000 | නැත | (5,000) |

ඉහත සඳහන් ආදායම් ගිණුම් සම්බන්ධයෙන් සිදු කළ විගණනයේදී පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

**(අ) 10.02.10.00 දරන ආදායම් සංකේතය - සමාජ වගකීම් බද්ද**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) මෙම ආදායම් සංකේතයට අදාළව වාර්ෂික ආදායම් ඇස්තමේන්තු සකස් කර නොතිබුණි. එසේ වුවද භාණ්ඩාගාර පරිගණක මුද්‍රිත සටහන් අනුව සමාලෝචිත වර්ෂයේදී රු.මිලියන 1.9 ක් හා පෙර වර්ෂයේදී රු.මිලියන 9 ක්ද වශයෙන් තත්‍ය ආදායම් උපයා තිබුණි.

(ii) පරිගණක මුද්‍රිත සටහන් අනුව හා ගිණුමේ ඩී.ජී.එස්.ඒ ආදායම් I ආකෘතිය අනුව රැස් කළ මුළු ශුද්ධ ආදායම රු.මිලියන 1.9 ක් වුවද ඩී.ජී.එස්.ඒ ආදායම් II ආකෘතියේදී වාර්තා කරනු ලබන වසර තුළ හිඟ මුදලට අනුරූපීව රැස් කරන ලද මුළු ප්‍රමාණය රු.මිලියන 1.9 ක් ලෙස දැක්වීමෙන් රු. 59,721 ක වෙනසක් නිරීක්ෂණය විය. ඉන් රු. 58,654 ක් අංක 10.04.01.01 - ආදායම් බදු සංකේතාංකයට බැර වූ මුදල් විය.

(iii) 2017 දෙසැම්බර් 31 දිනට රේගු දෙපාර්තමේන්තුවේ අයවිය යුතු රු.මිලියන 72.32 ක හිඟ ආදායම් ශේෂය පිළිබඳ විස්තරාත්මක උප ලේඛනයක් ඉදිරිපත් නොවුණි.

(iv) මුදල් රෙගුලාසි 128 (2) (ඉ) අනුව රාජ්‍ය ආදායම එකතු කිරීම සම්බන්ධව කටයුතු කරන ගණන් දීමේ නිලධාරීන් සහ දෙපාර්තමේන්තු විමසා රජයට ලැබිය යුතුව තිබෙන හිඟ ආදායම් අප්‍රමාදව එකතු කර ගැනීම සම්බන්ධව විශේෂ විධිවිධාන යොදවන බවට රාජ්‍ය ආදායම් පිළිබඳ ගණන්දීමේ නිලධාරියෙකු විසින් වගකීමට බැඳේ. එසේ වුවද, මෙම ආදායම් සංකේතාංකයට අදාළ හිඟ ආදායම් අයකර ගැනීමට කාලීන හා කඩිනම් පියවර ගෙන ඇති බව විගණනයේදී නිරීක්ෂණය නොවුණි.

(ආ) **20.05.01.00 දරන ආදායම් සංකේතය - මහ බැංකු ලාභ**
**------------------------------------------------------------------------------**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) මෙම ආදායම් සංකේතාංකය යටතේ සමාලෝචිත වර්ෂය සඳහා රු.මිලියන 5,000 ක් වූ මූලික ඇස්තමේන්තුව එලෙසම සංශෝධනයකින් තොරව පවත්වා ගෙන ගොස් තිබුණද වර්ෂය තුළදී කිසිදු ආදායම් රැස් කිරීමක් වාර්තා කර නොතිබුණි. එසේ වුවද, 2017 වර්ෂය සඳහා මහ බැංකුවේ බදු පසු ශුද්ධ ලාභය වූ රු.මිලියන 48,356.37 ක් විභජනය කිරීමෙන් පසු රු.මිලියන 14,227.10 ක් ඒකාබද්ධ අරමුදලට බැර කළ යුතු ලෙස දක්වා තිබුණද ඉන් කිසිදු මුදලක් ආදායම් ලෙස මෙම ගිණුමට රැස් කර ගෙන නොතිබුණි.

(ii) 2016 වර්ෂයේ මහ බැංකුවේ බදු පසු ශුද්ධ ලාභය රු.මිලියන 22,179.52 ක් වී තිබුණු අතර ඉන් 1949 අංක 58 දරන මුදල් නීති පනතේ (VI) වන කොටසේ 39 වන වගන්තිය ප්‍රකාරව ලාභ විභජනය කිරීමෙන් පසු ඒකාබද්ධ අරමුදලට බැර කිරීමට තීරණය කරන ලද රු.මිලියන 6,378.27 කින් රු.මිලියන 5,000 ක් පමණක් බැර කර තිබීමෙන් රු.මිලියන 1,378.27 ක් ඒකාබද්ධ අරමුදලට බැර කර නොතිබුණි.

**2.5 අග්‍රිම ගිණුම**
**-------------**

සමාලෝචිත වර්ෂය සඳහා දෙපාර්තමේන්තුව විසින් පිළියෙල කර තිබුණු අග්‍රිම ඇස්තමේන්තුව අනුව මාසික ලබා ගැනීමට අපේක්ෂා කළ අග්‍රිමයන්, මාසික ඉල්ලුම් කළ අග්‍රිමයන් හා ලැබී තිබුණු අග්‍රිමයන් පිළිබඳ විස්තර පහත දැක්වේ.

| **මාසය** | **සැලසුම් කළ පරිදි ඉල්ලුම් කළ යුතු අග්‍රිමය** | **ඉල්ලුම් කළ අග්‍රිමය** | **ලැබී තිබුණු අග්‍රිමය** | **සැලසුම් කළ පරිදි ඉල්ලුම් කළ අග්‍රිමය හා ඉල්ලුම් කළ අග්‍රිමය අතර වෙනස** | **ඉල්ලුම් කළ අග්‍රිමය හා ලැබී තිබුණු අග්‍රිමය අතර වෙනස** |
|---|---|---|---|---|---|
| | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන |
| ජනවාරි | 5.0 | 4.3 | 4.7 | -0.7 | 0.4 |
| පෙබරවාරි | 4.8 | 5.5 | 3.5 | 0.7 | -2.0 |
| මාර්තු | 3677.5 | 9.1 | 7.2 | -3668.4 | -1.9 |
| අප්‍රේල් | 4.1 | 8.3 | 7.6 | 4.2 | -0.7 |
| මැයි | 8.1 | 4.0 | 1.5 | -4.1 | -2.5 |
| ජූනි | 4.0 | 3.7 | 3.4 | -0.3 | -0.3 |
| ජූලි | 4.0 | 5.5 | 5.1 | 1.5 | -0.4 |
| අගෝස්තු | 3.9 | 4.2 | 3.0 | 0.3 | -1.2 |
| සැප්තැම්බර් | 4.0 | 4.9 | 3.6 | 0.9 | -1.3 |
| ඔක්තෝම්බර් | 3.9 | 4.9 | 3.8 | 1.0 | -1.1 |
| නොවැම්බර් | 4.0 | 4.9 | 3.9 | 0.9 | -1.0 |
| දෙසැම්බර් | 8.3 | 6.9 | 3.8 | -1.4 | -1.1 |
| **එකතුව** | **3731.6** | **66.2** | **51.1** | **-3665.4** | **-13.1** |

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2017 දෙසැම්බර් 19 දින මූලධන වියදම් දැරීම සඳහා දෙපාර්තමේන්තුවට ලැබී තිබූ රු. 200,000 ක අත්මුදල් කිසිඳු කටයුත්තක් සඳහා නොයොදවා 2017 දෙසැම්බර් 29 වන දින භාණ්ඩාගාර නියෝජ්‍ය ලේකම් වෙත ආපසු යවා තිබුණි. තවද මේ පිළිබඳ විස්තර CIGAS වැඩසටහනේ ඇතුළත් දෙසැම්බර් මස අග්‍රිම ගිණුම තුළද ඇතුළත් නොවීය.

(ආ) භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවේ අංක TO/BE1/2/IMP/329/2017 හා 2017 ජනවාරි 09 දිනැතිව 2017 වර්ෂයේ අත්මුදල් සීමාව තීරණය කිරීම යන මැයෙන් දෙපාර්තමේන්තුව වෙත එවා තිබූ ලිපිය අනුව, මාසික අත්මුදල් සීමාව ,කාර්තුවකට වරක් සමාලෝචනය කර සත්‍ය තොරතුරු වාර්තා කරමින් අත්මුදල් සීමාවන් නිශ්චය කරවා ගැනීමට කටයුතු කළ යුතු බව දන්වා තිබුණද, දෙපාර්තමේන්තුව ඒ අනුව කටයුතු කළ බව නිරීක්ෂණය නොවීය.

## 2.6 මානව සම්පත් කළමනාකරණය

### 2.6.1 අනුයුක්ත කාර්ය මණ්ඩලය, තථ්‍ය කාර්ය මණ්ඩලය හා පුද්ගල පඩිනඩි සඳහා වියදම්

ඉහත 2.1 ඡේදයේ සඳහන් කාර්යභාරය ඉටු කිරීම සඳහා 2017 දෙසැම්බර් 31 දිනට අනුමත, තථ්‍ය හා පුරප්පාඩු කාර්ය මණ්ඩලය පිළිබඳ විස්තර පහත දැක්වේ. සමාලෝචිත වර්ෂය වෙනුවෙන් දෙපාර්තමේන්තුව විසින් පුද්ගල පඩිනඩි වැය කාණ්ඩය වෙනුවෙන් රු.මිලියන 30.05 ක් වැයකර තිබුණි. ඒ අනුව ඒක පුද්ගල පඩිනඩි වියදම රු.601,017 ක් වී තිබුණි.

| | සේවක නාමය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සේවක සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 20 | 14 | 06 |
| (ii) | තෘතියික මට්ටම | 03 | 02 | 01 |
| (iii) | ද්විතික මට්ටම | 23 | 20 | 03 |
| (iv) | ප්‍රාථමික මට්ටම | 14 | 14 | - |
| | එකතුව | 60 | 50 | 10 |

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ජ්‍යෙෂ්ඨ මට්ටම තුළ අතිරේක අධ්‍යක්ෂ ජනරාල් තනතුර හා නියෝජ්‍ය අධ්‍යක්ෂ / සහකාර අධ්‍යක්ෂ (ශ්‍රී.ලං.ප.සේ.) තනතුරු 02 ක් වසර ගණනාවක සිට පුරප්පාඩුව පවතින අතර ඊට හේතු විගණනයේදී අනාවරණය නොවීය. මෙම තනතුරු අවශ්‍ය නොවේ නම් කාර්යමණ්ඩල සමාලෝචනයක් සිදුකරගත යුතු වුවද, අවසන් වරට 2016 වර්ෂයේදී සිදු කළ කාර්ය මණ්ඩල සමාලෝචනයේදී හෝ මේ පිළිබඳව අවධානය යොමු කර නොතිබුණි.

(ආ) දෙපාර්තමේන්තුව ආරම්භයේ සිට පැවති ජ්‍යෙෂ්ඨ ආර්ථික විද්‍යාඥ, ආර්ථික විද්‍යාඥ හා සංඛ්‍යා ලේඛනඥ තනතුරු 2016 වර්ෂයේ කාර්ය මණ්ඩල සමාලෝචනයේදී අහෝසි කර තිබුණු නමුදු දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ හා ශ්‍රී ලංකා මහ බැංකුවේ නිලධාරීන් 04 දෙනෙකු සේවයේ යොදවා තිබුණි.

(ඇ) ඉහත කී පරිදි, නියෝජ්‍ය අධ්‍යක්ෂ / සහකාර අධ්‍යක්ෂ (ශ්‍රී.ලං.ප.සේ.) තනතුරු 02 ක් සඳහා දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ නිලධාරීන් දෙදෙනෙක් අනුයුක්ත කර 2014 වර්ෂයේ සිට වරින් වර ලිපි මඟින් සේවා කාලය දීර්ඝ කරමින් පැවති අතර එම නිලධාරීන් 2018 වර්ෂයේදී සේවයෙන් නිදහස් කර තිබුණි. කෙසේ වුවද, මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශයේ අංක MF1/1/1/03 හා 2018 මාර්තු 29 දිනැති එම නිලධාරීන්ගේ අවසන්වරට සේවා දිගු ලබා ගැනීමට ඉදිරිපත් කළ ලිපිය සඳහා පිළිතුරු එවූ ලිපියෙන් තවදුරටත් මෙලෙස සේවා දිගු කිරීම් ඉදිරිපත් නොකරන ලෙසත් ඒ සඳහා දෙපාර්තමේන්තුව තුළ වැඩපිළිවෙලක් සකස් කර ගන්නා ලෙසත් දන්වා තිබුණි.

(ඈ) අමාත්‍ය මණ්ඩල අනුමැතිය මත 2014 අප්‍රේල් 01 දින සිට දෙපාර්තමේන්තුවේ බදු උපදේශක තනතුරට අනුයුක්ත කළ නිලධාරිනිය සඳහා 2018 සැප්තැම්බර් 31 දක්වා අමාත්‍ය මණ්ඩල තීරණ අනුව දිගින් දිගටම සේවා දිගු ලබා දී තිබුණි.